# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1891/9 - 2014 දෙසැම්බර් මස 02 වැනි අඟහරුවාදා - 2014.12.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(ix).

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

137 වන වගන්තිය යටතේ වූ රීති

1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 70ආ වගන්තිය යටතේ පත් කරනු ලැබූ නිශ්චිත බලධරයා වන උසස් අධ්‍යාපන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එකී විශ්වවිද්‍යාල පනතේ 70ඇ හා 70ඈ යන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 137 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති.

ලේකම්,
උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
නිශ්චිත බලධරයා.

2014 දෙසැම්බර් මස 02 වැනි දින,
කොළඹ දී ය.

**රීති**

2013 අගෝස්තු මස 22 දින අංක 1824/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රීතිය මගින් සංශෝධනය කරනු ලැබූ 2013 අංක 01 දරන නිශ්චිත බලධරයාගේ (උපාධි ප්‍රදානය කිරීමේ ආයතන වශයෙන්, ආයතනය පිළිගැනීමට අදාළ බලතල) රීති පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) 31 වන රීතිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

"31. උපාධි ප්‍රදානය කිරීමේ ආයතන වශයෙන් පිළිගනු ලැබ ඇති සහ වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු ශිල්පය, වාස්තු විද්‍යාව සහ වෙනත් සමාන වෘත්තීය උපාධිවලට අදාළ අධ්‍යයන වැඩසටහන් පිරිනමනු ලබන සියලු රාජ්‍ය නොවන ආයතන විසින්, නිශ්චිත වෘත්තීය මණ්ඩලයෙන් අනුකූලතා සහතිකයක් ලබා ගත යුතු අතර, එම සහතිකය නිශ්චිත බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය."

12-560

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
1A - PG 2264— 500 (2014/12)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*